පෞද්ගලීකරණයට විකල්පයක් නැද්ද?

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

මිලින්ද මොරගොඩ විසිනි

පෞද්ගලීකරණය අද බොහෝ දෙනාගේ අවධානයට ලක් වූ මාතෘකාවකි. එමෙන්ම මෙය වැඩි දෙනෙකුට බලපාන ප්‍රශ්නයකි. මෑත කාලයේ පැවති සියලුම ආණ්ඩු රාජ්‍ය ආයතන අලාභ හෝ අකාර්යක්ෂම වන අවස්ථාවන්හිදී පෞද්ගලීකරණය කිරීම සුදුසු විකල්පයක් සේ හඳුනා ගත්හ.

එංගලන්තයේ හිටපු අගමැතිනි මාග්‍රට් තැචර් මහත්මිය බ්‍රිතාන්‍යයේ ගුවන් සේවය මෙන්ම, එරට ආකර කර්මාන්තය ද පෞද්ගලීකරණය කරමින් පෞද්ගලීකරණය ලොවට හඳුන්වා දුන්නාය. එකල තැචර් මහත්මියට රජයේ ව්‍යාපාර පෞද්ගලික අංශයට පැවරීම ඉදිරියේ ප්‍රබල විරෝධතාවලට මුහුණ දෙන්නට සිදුවිය.

පෞද්ගලීකරණය 1977 න් පසු ශ්‍රී ලංකාවේ පැවති සියලු ආණ්ඩු පිළිගත් නමුත් ක්‍රියාත්මක ස්වභාවයේදී කළමනාකරණයේ වෙනස්කම් නිසා විවිධ ස්වරූප ගත් වැඩසටහනකි. අද වන විට ලෝකයේ පිළිගැනීම වී ඇත්තේ ආණ්ඩු ව්‍යාපාර වලින් ඈත්විය යුතු බවයි. තරඟකාරීව, වැඩි ඵලදායීතාවයක් සහිතව, ඉක්මන් තීන්දු ගනිමින් ව්‍යාපාර ක්‍රියාත්මක කරන්නට ආණ්ඩු වලට ඇති හැකියාව අඩු බව ජාත්‍යන්තර මතයයි. ඒ නිසාම මේ වන විට ආණ්ඩු විසින් කළ යුතු වන්නේ පෞද්ගලික අංශයට ව්‍යාපාර මෙහෙය වන්නන්ට අවස්ථාවක් දෙමින්, ඒ සඳහා නීතිරීති හා යටිතල පහසුකම් සැලසීමට වෙහෙසීම බව පිළිගැනීමයි.

එහෙත් පෞද්ගලීකරණය නිසා දුප්පත් ජනතාව පීඩාවට පත්වන අවස්ථාවන්හිදී හා අත්‍යවශ්‍යම වන මහජන සේවාවන්ට යම් සරල මැදිහත් කමක් කරන්නට ආණ්ඩුවලට හැකියාව තිබිය හැකිය. අප රටේ පසුගිය කාලයේ අත්දැකීම් සලකා බලන විට පෙනී ගියේ විවිධ බලපෑම් හා කළමනාකරණ අකාර්යක්ෂමභාවය නිසා බොහෝ රාජ්‍ය ව්‍යවසායයන් බිඳවැටුණු බවයි. වැවිලි සමාගම්, ල.ං.ග.ම, දුම්රිය, විදුලිබල මණ්ඩලය වැනි උදාහරණ මේ සඳහා ඉදිරිපත් කරන්නට හැකිය. ශ්‍රී ලංකාවට විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමඟ ඇතිවූ තරඟකාරී බව නිසා එළැඹුන තත්ත්වය යටතේ ආණ්ඩුවේ ඇතැම් ව්‍යාපාර දුර්වල විය. එම ආයතන පෞද්ගලීකරණය කරනවා හැරෙන්නට අලාභ ලබමින් දිගින් දිගටම නඩත්තු කරන්නට හැකියාවක් නොතිබුණි.

පෞද්ගලීකරණ වැඩසටහන කවර ආණ්ඩුවක් හෝ දියත් කළේ සමාජයේ පූර්ණ එකඟතාව ඇතිව නොවේ. සෑම රජයකටම විරෝධතා එල්ල විය. යම් රාජ්‍ය ආයතනයක් ආර්ථික වශයෙන් බිඳ වැටී තිබියදී එය රජය විසින්ම පවත්වා ගෙන යන්නට තීරණය කළ හොත් ඊට අවශ්‍ය මුදල් උපයා ගත යුත්තේ ජනතාව මත බදු බර පැටවීමෙනි. මේ ආකාරයට දිගින් දිගටම ජනතාව පාඩු ලබන ව්‍යාපාර වල බර දරන්නට සූදානම්ද? යන ප්‍රශ්නය සමාජයෙන් විමසිය යුතුය. සමාජය ඊට සූදානම් නැතිනම් තවදුරටත් මෙම ආයතන පාඩු පිට ගෙන යන්නේ නැතිව තද තීරණ මත හොඳ කළමනාකරණයකට ලක් කළ යුතුය. දේශපාලනයෙන් තොරව එවැනි තීන්දු ගන්නට අද සමාජය සූදානම් ද යන ප්‍රශ්නය තිබේ. එසේ නැතිනම් රාජ්‍ය ව්‍යාපාර සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට විකුණා දැමීම හෝ රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ ව්‍යාපාර ලෙස ඒවා ප්‍රතිසංවිධානය කිරීම අවශ්‍යය.

ඇතැම් ආණ්ඩු බලයේ සිටින කාලයේදී පෞද්ගලිකකරණය සිදුවිය. ඊට එරෙහි වන්නට එදා ඔවුන්ට හැකියාව තිබුණේ නැත. එහෙත් විපක්ෂයේ සිටින විට එයට විරුද්ධ වෙයි. මෙලෙස තමන්ට වාසි වන අවස්ථාවලදී හැර අනෙක් අවස්ථාවලදී විරුද්ධ වීමෙන් රටට සමාජයට වැඩදායක වන්නේ නැත. අද යුගයට ගැලපෙන්නේ දේශපාලන රාමුවලට අනුව ආණ්ඩු මෙහෙය වීම නොවේ. ලෝක රටාවට අනුව තරඟය හා ඵලදායකත්වය වර්ධනය වන ලෙස ස්ථිර සාර ප්‍රතිපත්තිවලට අනුකූලව රාජ්‍ය තාන්ත්‍රික ලෙස කටයුතු කිරීමයි.

පෞද්ගලීකරණය, ජනතාකරණය, ඔබසතුකරණය යනාදි වශයෙන් විවිධ සැලසුම් කරනු ලැබුවත් අවසාන විග්‍රහයේදී සලකා බවන විට පෞද්ගලිකකරණය මගින් සිදු වන්නේ මහජනතාවට අවාසියක් සිදුවන ආණ්ඩුවකට පවත්වාගෙන යා නොහැකි කාර්යභාරයක් ඉටු කරන්නට තවත් පාර්ශවයක් සහය කර ගැනීමයි. දශක කිහිපයකට පෙර මෙම සංකල්පය පැවතුණේ නැත. මුලින් ද සඳහන් කළ පරිදි බ්‍රිතාන්‍යයේදී ප්‍රථමයෙන් පෞද්ගලිකකරණය ගැන අත්හදා බැලීම් කරන්නට පළමුව ලොව ඕනෑම රටක් පෞද්ගලික ව්‍යාපාර දෙස බැලුවේ තරමක් වැරදි දෘෂ්ටියකින්ය. මෙම පෞද්ගලික ව්‍යාපාරවලින් ධනය උපයා ගන්නා නමුත් එයින් රටට, මහජනතාවට සෙතක් අත්පත් නොවන බව එම කාලයේ අදහස විය.

එමෙන්ම පෞද්ගලික ආයතන පවා රජයට පවරා ගන්නා ප්‍රතිපත්තියක් එම යුගයේ දී පැවතිනි. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කරමින් සිටි වැවිලි සමාගම්, ගෑස්, ඛනිජ තෙල් වැනි ආයෝජන අංශය රජයට පවරා ගනු ලැබූ අතර එම සමාගම්වලට මහජන මුදලින් වන්දි ගෙවනු ලැබීය. එම කාලයේ ලොව පැවති බල තුලනය සහ හැකිලුනු ආර්ථික ක්‍රමය අනුව ප්‍රාග්ධනය හා සම්පත් රජය භාරයේ තබාගෙන ව්‍යාපාර මෙහෙය වීම සාධාරණ උපාය මාර්ගයක් වූවා විය හැකි ය. නමුත් මේ වන විට එය එසේ නොවී. කෙසේ වෙතත් සාමජය තුළ පෞද්ගලිකකරණය ගැන පැහැදිලි අදහස් නැති බව පෙනේ. ඇත්තේ නොපැහැදිලි චිත්‍රයකි. මෙය තම නැණ පමණින් වටහා ගන්නා ජනතාව ඊට නොයෙක් අර්ථකතන සපයති. එසේ වුවද දියුණු රටවල ආදර්ශ සලකා බලන විට වඩාත් තරඟකාරී වාණිජ ලෝකය සමඟ ක්‍රියා කරන්නට රාජ්‍ය අංශයට වඩා පෞද්ගලික අංශය සමත්ය. විශේෂයෙන්ම මෙම තත්ත්වය තුළ රජය හෝ පෞද්ගලික ඒකාධිකාරය බිහිවීම මගින් ලාබ උපරිම කරගන්නා ක්‍රමය ද අවලංගු වී තිබේ.

රාජ්‍ය අංශයට අද තිබෙන නීතිමය තත්ත්වය තුළ කඩිනම් තීරණ ගන්නට ඉඩ නැත. මූල්‍ය රෙගුලාසි, පරිපාලන රෙගුලාසි, ආයතන සංග්‍රහය ආදි නොයෙක් නීතිමය විධිවිධාන සම්පූර්ණ කරගෙන වාණිජ කටයුතු වලට යෙදෙන්නට රාජ්‍ය ආයතන වලට සිදුවේ. මේ පටිපාටි අනුගමනය කරන විට ඊට සෑහෙන කාලයක් ගත වන නිසා රජයකට තරඟකාරී ලෙස වාණිජ කටයුතු වල යෙදීමට විවිධ බාධා එල්ලවන බව ඉතා පැහැදිලි ය.විශේෂයෙන්ම පලදායීතාව හා කාර්යක්ෂමතාව ගැන රාජ්‍ය අංශයේ අදහස් ඉතා සැහැල්ලුය. ආයතන, වාණිජ ආයතන ලෙස නොව තවත් රාජ්‍ය ආයතනයක් පමණක් ලෙස නිලධාරීන්ට පෙනේ. මෙම තත්ත්වය තුළ තරඟකාරී වාණිජ කටයුතු වලට ඉඩක් නැත. එනිසා අද ආණ්ඩුවට සිදුවී තිබෙන්නේ මෙවැනි අකාර්යක්ෂම තත්ත්වයට පත්වී තිබෙන ආයතන මෙන්ම දැනට හොඳ තත්ත්වයේ තිබුණ ද අනාගතයේදී තරඟයට මුහුණදීම අසීරු වෙතැයි සිතන රාජ්‍ය ආයතන ප්‍රතිසංවිධානය කිරීම ය.

පෞද්ගලිකකරණය කිරීමෙහිලා හේතු වූ ප්‍රධානතම සාධකය අලාභ ලැබීම හා අකාර්යක්ෂමතාවය බව අමතක කළ යුතු නැත. එමෙන්ම පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාරවල අලාභය ගෙවනු ලැබුවේ රජයේ අයවැය ලේඛනයෙනි. මහජන බදු වැඩි වැඩියෙන් අය කර ගනිමින් හෝ දෙස් විදෙස් වශයෙන් ලබාගන්නා ණය වක්‍රව පාවිච්චි කරමින් හෝ රජයට අයත් සමාගම් යන අභිමානය පමණක් ඇතිව මෙම ආයතන පවත්වාගෙන යායුතුද යන තර්කය ආණ්ඩුවලට ඉතිරිව තිබිණ. රාජ්‍ය ආදායම ඉතිරි කරන මගක් ලෙස පාඩු ලබන ආයතන වඩා හොඳින් කළ හැකි ව්‍යාපාරික අංශ වෙත පවරා එම ආයතනවලින් ලබන බදු ආදායම පමණක් රටට ලබා ගැනීමෙන් මෙයට වඩා හොඳ පාලනයකට ගමන් කළ හැකි ය. ගුවන් තොටුපළ, වරාය, ටෙලිකොම් වශයෙන් ඇතැම් රාජ්‍ය ආයතන පෞද්ගලිකකරණය කිරීමෙන් එම අපේක්ෂිත ප්‍රතිඵලය ළඟා කර ගත හැකි විය.

නමුත් ලෝකයේ ඇතැම් රටවල රාජ්‍ය අංශය සාර්ථක ලෙස ව්‍යාපාර මෙහෙය වන බවද අමතක කළ යුතු නැත. ශ්‍රී ලංකාවේදී ව්‍යාපාර මෙහෙයවන බව ද අමතක කළ යුතු නැත. ශ්‍රී ලංකාවේදී ව්‍යාපාර මෙහෙය වන ඉන්දියන් ඔයිල් සමාගම එයින් එකකි. එය ලොව ප්‍රධානතම ෆෝචූන් 500 සමාගම් ගණයට සැලකෙන එකකි. රජයට අනුබද්ධ වූවත් ඉන්දියන් ඔයිල් සමාගම පාලනය වන්නේ ස්වාධීන පිළිවෙත් අනුවය. දේශපාලනඥයන් එහි පාලනයට ඇඟිලි ගැසීමක් හෝ රැකියා දෙන ලෙස බල කිරීමක් කරන්නේ නැත. සිංගප්පූරු ගුවන් සේවය, සිංගප්පූරු රජයේ බැංකු පවත්වාගෙන යන්නේ ද එලෙසය.

මේ නිසා ශ්‍රී ලංකාවටද ඉගෙන ගත හැකි පාඩමක් තිබේ. අපටත් මෙම ආයතන කිසිදු අයුරකින් පෞද්ගලීකරණය කිරීමෙන් තොරව පවත්වාගෙන යන්නට හැකිය. නමුත් එවිට දේශපාලන සම්බන්ධකම් ඇති සභාපති හෝ කළමනාකාර අධ්‍යක්ෂවරුන් පත් නොවිය යුතුය. රජයේ දේශපාලනඥයන්ගේ බලපෑම්වලින් තොර විය යුතුය. එවැනි පිළිවෙතක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ හැකි වෙයිද? නො එසේ නම් පෞද්ගලිකකරණය විනා වෙන විකල්පයක් නැත. රටට පෞද්ගලීකරණය එකම විසඳුම නොවන නමුත් දැනට වෙනත් විකල්පයක් නැති බව තේරුම් ගැනීම අවශ්‍ය ය.